ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද්

# ද මැසිනොද් විදුහල, කඳාන

# De Mazenod College, Kandana

## ගණිතය

පළමු වාර පරීක්ෂණය - 2024 | 7 ශ්‍රේණිය | කාලය

Learning Resource
R
De Mazenod College
Kandana

### I කොටස

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. 2 + 5 x 4 ÷ 2 සුළු කරන්න.

02. 0 ත් 20 ත් අතර ඇති සමචතුරශ්‍ර සංඛ්‍යා කුලකය ලියා දක්වන්න.

03. පහත රූප තුනම භාවිතා කරමින් සංයුක්ත තල රූපයක දළ සටහනක් ඇඳ එහි සමමිති අක්ෂ ඇඳ ලකුණු කර පෙන්වන්න.




04. 56 □ යන සංඛ්‍යාව 9 න් ඉතිරි නැතිව බෙදෙන්නේ නම්, හිස් කොටුවට අදාළ සංඛ්‍යාව ලියන්න.

05. පහත සඳහන් ප්‍රකාශනය නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

i. වෘත්තයක ආස්තරයක සමමිති අක්ෂ ගණන සෘජුකෝණාස්‍රාකාර ආස්තරයක සමමිති අක්ෂ ගණනට වඩා වැඩිය.

06. 20 ත් 30 ත් අතර ඇති 4 හි ගුණාකාර සියල්ල ලියා දක්වන්න.

07. (-2) + (-1) හි අගය සංඛ්‍යා රේඛාවක් ආධාරයෙන් සොයන්න.

08. $5^3$ යන් දර්ශක අංකනය කියවන ආකාරය ලියන්න.

09. වෙන් රූප සටහනකින් A නම් කුලකය නිරූපනය කර ඇත. A කුලකයේ අවයව සඟල වරහනක් තුළ ලිවීමෙන් කුලකය ලියා දක්වන්න.




10. පහත දී ඇති ප්‍රකාශන අතරින් සත්‍ය ප්‍රකාශන ඉදිරියේ ( √ ) ලකුණද අසත්‍ය ප්‍රකාශන ඉදිරියේ ( x ) ලකුණ ද යොදන්න.

i. 7 + 1 x 3 = 24 ( )

ii. 12 – 4 ÷ 2 = 10 ( )

11. පහත සඳහන් රූපය පිටපත් කර ද්විපාශ්වික සමමිතික රූප ලැබෙන සේ ඒවා සම්පූර්ණ කරන්න.



12. අගය සොයන්න. 5 (29 + 3)

13. 54 හි ප්‍රාථමික වල ගුණිතයක් ලෙස ලියන්න.

14. එක්තරා පන්තියක දරුවන් අතර බෙදාදීම සඳහා ත්‍යාග ලෙස චොකලට් 24ක් ද ටොෆි 60 ක් ද ලොලිපොප් 84 ක් ද ලබා දුනි. සෑම ළමයෙකුටම සෑම වර්ගයකින්ම සමානව ලැබෙන සේ මේවා බෙදා දුන්නේ නම් එම පංතියේ සිටින උපරිම ළමුන් ගණන කීයද?

15. 1542 යන සංඛ්‍යාව 3න්, 4න්, 6න්, හා 9 න් බෙදේ දැයි බෙදීමෙන් තොරව පරීක්ෂා කර ලියන්න.

16. හිස් තැන් පුරවන්න.

i. (+3) + .......... = (+8)

ii. .............. + (-5) = (+2)

17. $x=2, y=1$ නම් $4x^2y$ හි අගය සොයන්න.

18. 267, 306, 745, 4128, 3700, 8094 යන සංඛ්‍යා අතරින් 6න් බෙදෙන සංඛ්‍යා තෝරා ලියන්න.

19. 2, 4 හා 9 හි කු.පො.ගු සොයන්න.

20. 72 යන සංඛ්‍යාවේ පාද ප්‍රථමක සංඛ්‍යා වූ බලවල ගුණිතයක් ලෙස ලියන්න.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01. a) i සාධකයක් යනු කුමක් ද? (ල.2)

ii. 42 හි සියළුම සාධක ලියා දක්වන්න. (එක් සාධකයක් හෝ අඩුවුවහොත් ලකුණු හිමි නොවේ) (ල.3)

iii. 12 හි මුල් ගුණාකාර 5 ක් ලියන්න. (ල.3)

b) i) 16, 24, 32 හි ම.පො.සා සොයන්න (ල.2)

ii) 14, 35, 42 හි කු.පො.ගු. සොයන්න. (ල.2)

c) එක්තරා පුද්ගලයෙකු A නම් බෙහෙත් පෙත්ත පැය 4 කට වරක් ද B නම් බෙහෙත් පෙත්ත පැය 8 කට වරක් ද C නම් බෙහෙත් පෙත්ත පැය 16 කට වරක් ද ලබාගත යුතුව ඇත. ඔහු බෙහෙත් පෙති 3 ම එකවර අද දින පෙ.ව. 7.00 ට ලබා ගත්තේ නම් නැවත පෙති 3 ම එකවර ලබාගත යුතු වේලාව සොයන්න. (ල.4)

02. a) i. කුලකයක් යනු කුමක් ද? (ල.1)

ii. කුලකයක් සංවෘත රූපයක් මගින් දැක්වීම හඳුන්වන්නේ කෙසේ ද? (ල.2)

b) i. P = {1 ත් 20 ත් අතර 3 හි ගුණාකාර}

P කුලකය අවයව මගින් ලියා දක්වන්න. (ල.2)

ii. B ⟶




B කුලකයේ අවයව නිශ්චිතව හඳුනා ගත හැකි පොදු ලක්ෂණයක් මගින් ලියා දක්වන්න. (ල.3)

iii. A { waterfall යන වචනයේ අකුරු }

A කුලකයේ අවයව සියල්ල සඟල වරහන් තුළ ලියා දක්වන්න. (ල.3)

03. a) i. 125 පාදය 5 වූ දර්ශක අංකනයෙන් ලියන්න. (ල.1)

ii. 36 පාද ප්‍රථමක සංඛ්‍යා වූ බලවල ගුණිතයක් ලෙස ලියා දක්වන්න. (ල.2)

b) i. 3 x 3 P x P x q ප්‍රකාශනය දර්ශක අංකනයෙන් ලියන්න.

ii. විහිදුවා ලියන්න $5x^3y^2$

iii. විහිදුවා ලියන්න. අගය සොයන්න $4^2 \times 3$ (ල.6)

c) i. a = 3 හා b = 5 වනවිට, $2a^2b^2$ හි අගය සොයන්න. (ල.2)

04. a) i. ද්වි පාශර්වික සමමිති තල රූපයක් යනු කුමක් ද? (ල.1)

ii. දී ඇති තල රූප සටහන් වල සමමිති අක්ෂ අඳින්න. (ල.2)



iii. පහත දී ඇති සමමිති අක්ෂ ගණන සහිත ජ්‍යාමිතික හැඩතල සහිත තල රූප නම් කරන්න.

a. එකක් පමණක් ඇති

b. දෙකක් පමණක් ඇති

c. තුනක් පමණක් ඇති

d. අනන්ත සංඛ්‍යාවක් ඇති (ල.4)

b) i. වෘත්තයක කේන්ද්‍රය සොයා ගැනීම සඳහා සුදුසු ක්‍රමයක් විස්තර කරන්න. (ල.2)

ii. එක්තරා ත්‍රිකෝණයකට සමමිති අක්ෂ එකක්වත් නැති බව ගුරුතුමා පවසයි. ඔබ ඔහු හා එකඟ වන්නේ ද? හේතු දක්වමින් පැහැදිලි කරන්න. (ල.2)

05. a) i. 6325 යන සංඛ්‍යාවේ ඉලක්කම් දශර්කය කුමක් ද? (ල.1)

ii. බෙදීමෙන් තොරව සංඛ්‍යාවක් 3 න් බෙදෙන්නේ දැයි සෙවිය හැකි ක්‍රමයක් ලියා දක්වන්න. (ල.1)

iii. 84 ☐ යන ඉලක්කම් තුනකින් යුත් සංඛ්‍යාව 6 න් ඉතිරි නැතිව බෙදේ නම් එකස්ථානයේ තිබිය හැකි ඉලක්කම් මොනවා ද?

b) සුළු කරන්න.

i. $8 + 3 \times 4 \div 3 =$

ii. $200 - (10 \times 4) \div 2 + 10 =$

iii. කුලී රථයක් පළමු කිලෝමීටරයට රු. 80 ක්ද ඊට වැඩිවන සෑම කිලෝමීටරයකටම රු. 55 බැගින්ද අයකරනු ලැබේ. මෙම රථයෙන් කිලෝමීටර 26 ක් ගමන්ගත් මගියෙකු ගෙවිය යුතු මුළු මුදල සඳහා සංඛ්‍යාත්මක ප්‍රකාශනයක් ලියා එය සුළු කරන්න.

06. a) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සුළු කරන්න.

i. $(+5) + (-3)$

ii. $(-3) + (-2)$ (ල.4)

b) අගය සොයන්න

i. $(+4) + (+2)$

ii. $(-\frac{3}{7}) + (+\frac{2}{7})$

iii. $(+2.4) + (-4.6)$

iv. $(-3) + (+1)$ (ල.4)

c) එක්තරා දිනක ජපානයේ ටෝකියෝ නගරයේ පෙ.ව. 3.00 වන විට උෂ්ණත්වය $-3.6\ ^0C$ ව පැවති උෂ්ණත්වය $8\ ^0C$ කින් වැඩිවිය. පෙ.ව 7.00 වන විට ටෝකියෝ නගරයේ උෂ්ණත්වය සොයන්න. (ල.3)